(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 1(8).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 දෙසැම්බර් මස 04 වැනි සිකුරාදා**

---

## 2015 දෙසැම්බර් මස 16 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

170/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 අතර කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් ක්‍රීඩාපිටි සහ ග්‍රාමීය ක්‍රීඩාපිටි වැඩිදියුණු කිරීම සඳහා මුදල් වෙන්කිරීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

(iii) දිස්ත්‍රික්කය පුරා එම මුදලින් ඉදිකළ ක්‍රීඩාපිටි සංඛ්‍යාව කොපමණද;

(iv) එම ක්‍රීඩාපිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඒ සඳහා වෙන් කළ මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මුදල් වෙන් කර වැඩ අවසන් වූ ක්‍රීඩාපිටි තිබේද;

(ii) එසේ නම්, ඒවා කොට්ඨාස අනුව කවරේද;

(iii) වැඩ අවසන් නොවී ඇති ක්‍රීඩාපිටි සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ වැඩ අවසන් කිරීමට තවදුරටත් අවශ්‍ය වන මුදල කොපමණද;

(v) එම මුදල් ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

207/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර, කැප්පෙටිපොල මාවත, අංක 14/3 දරන ස්ථානයේ එවකට පදිංචිව සිටි කේ. එස්. නාජිර්දීන් මහතා සහ එම පවුලේ සාමාජිකයින්ට අයත් නිවස, බස් නැවතුම්පොල දෙවන අදියර ඉදිකිරීම සඳහා කඩා ඉවත් කරන ලද බවත්;

(ii) නාජිර්දීන් මහතා සහ පවුලේ සාමාජිකයින්ට පල්ලේකැලේ, ගම්උදා භූමියේ පිහිටි පේළි නිවාස අංක 02 යන ස්ථානයේ තාවකාලික පදිංචිය සඳහා අවසර ලබාදී තිබුණද, නාගරික සංවර්ධන අධිකාරිය මගින් ස්ථිර නිවසක් මෙතෙක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නාජිර්දීන් මහතාගේ වැන්දඹු බිරිඳ සිය දරුවන් සමග දැනට දෙල්තොට, රලිමන්ගොඩ, අංක 402 දරන ස්ථානයේ පදිංචි වී සිටින අතර, නාගරික සංවර්ධන අධිකාරියේ මධ්‍යම පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂගේ අංක 5/සීපී/8/5/11 හා 1997/11/12 දිනැති ලිපිය මගින් පොරොන්දු වී ඇති පරිදි පදිංචිය සඳහා, මහනුවර නගරයේ නිවසක් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

218/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1990 වනවිට මෙරට තිබූ සුරා සැල් සංඛ්‍යාව සහ සුරා බලපත් හිමිව තිබූ අවන්හල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 1990-1994,1995-1999, 2000-2004, 2005-2009, 2010-2014 සහ 2015.01.01 සිට 2015.11.01 දක්වා,

(i) රජය විසින් නිකුත් කරනු ලැබූ සුරා බලපත් සංඛ්‍යාව;

(ii) සුරා බලපත් නිකුත් කරනු ලැබූ අවන්හල් සංඛ්‍යාව;

(iii) සුරා බලපත් නිකුත් කරනු ලැබූ සංචාරක හෝටල් සංඛ්‍යාව;

එක් එක් කාලසීමාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (i), (ii) සහ (iii) හි සඳහන් සුරා බලපත් හිමි පුද්ගලයින්ගේ නාමලේඛනය, අදාළ වාණිජ ලිපිනයන් සමග එක් එක් කාලසීමාව, අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) 2015.01.01 සිට 2015.11.01 දක්වා ශ්‍රී ලංකාව තුළ විකුණන ලද සුරා ප්‍රමාණය, එක් එක් දිස්ත්‍රික්කය අනුව සහ සුරා වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වර්ෂ 2013, 2014 සහ 2015 නොවැම්බර් 01 දින දක්වා කාලය තුළ රාජ්‍ය ආදායමට සුරා බදු ලබාදුන් දායකත්වයෙහි අගය, මුල්‍යමය වශයෙන් සහ රාජ්‍ය ආදායමෙහි ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

226/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය යටතේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සිදු වූ වංචා දූෂණ විමර්ශනය කිරීම සඳහා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් රවී අල්ගම මහතාගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත් කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයින්ගේ නම් කවරේද;

(iii) එම කමිටුව පත්කරන ලද දිනය කවරේද;

(iv) අදාළ කමිටුවේ වාර්තාව සකස් කිරීම සඳහා දරන ලද වියදම කොපමණද;

(v) එම වාර්තාව සැකසීම අවසන් කර තිබේද; එසේ නම්, එම දිනය කවරේද;

(vi) එම වාර්තාවෙන් හඳුනා ගත් දැඩි අක්‍රමිකතා, දූෂණ වංචා කවරේද;

(vii) එම කමිටු වාර්තාව සභාගත කරන්නේද;

(viii) අදාළ කමිටු වාර්තාවෙන් චෝදනා ඉදිරිපත් වූ අය ඇත්නම්, ඔවුන්ගේ නම් කවරේද;

(ix) ඔවුන්ට අදාළව ගෙන ඇති විනය හා නීතිමය පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

243/'15

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන්, වර්ෂ 2000 සිට 2014 දක්වා වාර්ෂිකව හිමිකර ගෙන තිබූ විශේෂ හැරගැණුම් හිමිකම් (වි.හැ.හි / SDR) ප්‍රමාණය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශේෂ හැරගැණුම් අයිතිවාසිකම්, රට සතු විදේශ සංචිතයෙහි කොටසක් ලෙස සැලකෙන අයුරින් ශ්‍රී ලංකාව විසින් ලබා ගන්නා විදේශීය ණය, විදේශ සංචිතවල කොටසක් ලෙස සලකනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2000 සිට 2014 දක්වා කාලයට අදාළව විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සම්පස්ථ ණය පහසුකම් සඳහා වන ගෙවීම්, රට සතු විදේශ සංචිත කෙරෙහි ඇති කළ බලපෑම;

(ii) 2000 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාව මෙතෙක් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රමාණය, ඒවායේ පොලී අනුපාතය සහ ඵලදායීත්වය;

(iii) ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව විදේශ සංචිත කෙරෙහි ඇති කළ බලපෑම;

වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 17 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

194/'15

ගරු ජයන්ත සමරවීර මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) එල්. ටී. ටී. ඊ. ත්‍රස්ත ක්‍රියාවන්ට සම්බන්ධවීම හේතුවෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතට ගැනෙන වැරදි සඳහා සැකකරුවන් වී සිටින සහ දඬුවම් ලබා ඇති පුද්ගලයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඔවුන්ගේ නම්, වරදේ ස්වභාවය, ඔවුන් දැනට රඳවා තිබෙන බන්ධනාගාරය හා සිර මැදිරි අංකය, සිරකරුවා අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) 2015 ජනවාරි සිට 2015 ඔක්තෝබර් 20 දක්වා කාලය තුළ ඇප ලබාදී ඇති හා නිදහස්කර ඇති එල්. ටී. ටී. ඊ. සැකකරුවන් හා සිරකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඔවුන්ගේ නම්, ඇප ලබාදුන් හෝ නිදහස් කළ උසාවිය, සිරකඳවුර හා නිදහස් කළ දිනය එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඉ) (i) එල්. ටී. ටී. ඊ. ත්‍රස්ත ක්‍රියාවන්ට සම්බන්ධ වැරදි සඳහා දඬුවම් ලැබූවන් දේශපාලන සිරකරුවන් වශයෙන් සැලකීමට රජය නිගමනයකට එළඹ තිබේද;

(ii) එසේ නම්, එසේ නිගමනයකට එළඹීමට හේතු කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

219/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි මස 01 දින වනවිට මෙරට ලියාපදිංචි කර තිබූ රාජ්‍ය නොවන සංවිධාන (NGO) සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGO) කවරේද;

(ii) එම සංවිධානයන්හි ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) 2015.01.01 දින සිට 2015.11.01 දින දක්වා මෙරට ලියාපදිංචි කර ඇති රාජ්‍ය නොවන සංවිධාන (NGO) සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන (INGO) කවරේද;

(ii) එම සංවිධානයන්හි සංවිධායකයින්ගේ සම්බන්ධීකරණ තොරතුරු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් සංවිධානයන්ට,

(i) 2000.01.01 දින සිට මේ වනතෙක් ලැබී ඇති වාර්ෂික මූල්‍යාධාර ප්‍රමාණය;

(ii) එකී අරමුදල් සපයා ඇති විදේශ රාජ්‍ය හෝ සංවිධාන කවරේද;

(iii) එකී අරමුදල් සම්පාදනය කොට ඇති විදේශ රාජ්‍ය හා සංවිධාන අදාළ අරමුදල් ලබාදී ඇති අරමුණු;

කවරේද යන්න එක් එක් සංවිධානය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා තවදුරටත් මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

230/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2011 සිට 2014 අවසන් භාගය දක්වා කාලය තුළ යාපනයේ ලොරි රථ හිමියන්ගෙන්, දේශපාලන බලපෑම් මත "මහේෂ්වරී පදනම" නම් සංවිධානයක් විසින් දෛනිකව මුදල් එකතු කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එක් ගමන් වාරයක් සඳහා රු.300.00ක මුදලක් ලබාගෙන තිබේද;

(ii) ලොරි හිමියන්ගේ සංගමයේ බලවත් අකමැත්ත මත, දෛනිකව මුදල් එකතු කළ මහේෂ්වරී පදනම ක්‍රියාත්මක වූයේ කවර දේශපාලනඥයකුගේ අධිකාරි බලයක් යටතේද;

(iii) මහේෂ්වරී පදනම නෛතික ආයතනයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රිසිට් පත් නිකුත් කරමින් වර්ෂ 2010 - 2014 කාලය තුළ ලොරි රථ වලින් දෛනිකව එකතු කළ මුදල කොපමණද;

(ii) මහේෂ්වරී පදනම යම් රාජ්‍ය ආයතනයක් විසින් අධීක්ෂණය කරනු ලැබුවේද;

(iii) එමගින් ලොරි රථ හිමියන්ට සලසා ඇති සහනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙසේ නිල වශයෙන් කප්පම් ලබා ගැනීමට එරෙහිව යාපනය ලොරි රථ හිමියන්ගේ සංගමය විසින් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට කරන ලද පැමිණිල්ලේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) අනීතික අයුරින් එකතු කරන ලද මුදල් අදාළ ලොරි හිමියන්ට ආපසු ලබාදීමට මැදිහත් වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

244/'15

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2000 සිට 2014 දක්වා,

(i) ශ්‍රී ලංකාව සතු ශුද්ධ විදේශ සංචිත තත්ත්වයෙහි වෙනස්වීම;

(ii) ගෙවුම් තුලන අත්පොතෙහි 6 වන සංස්කරණය අනුව, "සංචිත වත්කම් තත්ත්වය" සහ "සංචිත ආශ්‍රිත වගකීම් තත්ත්වය";

(iii) BPM6 අනුව ගැලපුම් කළ ශ්‍රී ලංකා ගෙවුම් තුලාවෙහි සමස්ත ශේෂය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

246/'15

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට 2015.01.30න් පසු පත් කළ සභාපතිවරයා විසින් පසුගිය මාස 10 තුළ ලබාගත්, මාසික වැටුප/ඉන්ධන හා දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) තමන්ට හිමි වැටුප/ඉන්ධන හා දීමනාවන්ට අමතරව සභාපතිවරයා විසින් යම් මුදලක්/දීමනාවක් ලබාගෙන ඇත්නම්, ඒවා නැවත අයකර ගන්නේද;

(iii) 2015.01.30 සිට 2015.10.30 දක්වා වන කාලය තුළ උත්සව සඳහා කොපමණ මුදලක් වැයකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් , ඒ මන්ද?

---

## 2015 දෙසැම්බර් මස 18 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

53/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ ආධාර මත පවත්වාගෙන යනු ලබන ආගමික සංවිධාන යටතේ පාලනය වන අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ආගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත අධ්‍යාපන ආයතනයන්හි නම්, ලිපින හා දුරකථන අංක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත, (අ)(iii) හි සඳහන් අධ්‍යාපන ආයතනයන්හි ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව, එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අධ්‍යාපන ආයතනයන්හි කාර්ය මණ්ඩලවල සංයුතිය කවරේද;

(iii) උක්ත ආයතනයන්ට රජය වර්ෂයකට වැය කරන මුදල එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

195/'15

ගරු විජිත හේරත් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ, බෝගස්වැව කලාපයේ, යුද්ධයෙන් අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ පවුල් 312ක් නැවත පදිංචිකර ඇති බවත්;

(ii) මෙම වැඩසටහන යටතේ ඔවුන්ට ගොඩ ඉඩම් අක්කර 1ක් සහ කුඹුරු ඉඩම් අක්කර 1ක් ලබාදීමට නියමිතව තිබූ බවත්;

(iii) මේ වනවිට අවුරුදු 3ක් ගතවී ඇතත්, ඉහත සඳහන් පරිදි ඉඩම් ලබාදීමක් සිදුවී නොමැති බවත්;

(iv) තම ජීවනෝපාය අහිමි වීමෙන් ඔවුන් අන්ත අසරණ තත්ත්වයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

248/'15

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2011 - 2014 කාලය තුළ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය කාර්යක්ෂමව පවත්වාගෙන යෑම තුළින් C මට්ටමේ සිට B මට්ටමේ රාජ්‍ය ආයතනයක් බවට උසස් වූ බවත්;

(ii) පසුගිය මාස 10ක කාලය තුළ එහි පරිපාලන අකාර්යක්ෂමතාවය හේතුවෙන් නැවතත් C මට්ටමට පහත වැටී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ආයතනය නැවත යථා තත්ත්වයට පත් කිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් , ඒ මන්ද?

253/'15

ගරු බිමල් රත්නායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා විදේශීය දූත මණ්ඩල කාර්යාල පිහිටුවා ඇති රටවල් හා උප කාර්යාල (Consulates) පිහිටුවා ඇති රටවල් හා නගර කවරේද;

(ii) එක් එක් විදේශීය දූත මණ්ඩලවල ප්‍රධානීන්ගේ හා නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානීන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (අ)(ii) හි සඳහන් පිරිස අතරින් ස්ථිර ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් වන හා අයත් නොවන පුද්ගලයින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ශ්‍රී ලංකා විදේශ සේවයට අදාළ නොවන දූත මණ්ඩල ප්‍රධානීන් හා නියෝජ්‍ය ප්‍රධානීන් සේවය කරන රටවල් කවරේද;

(v) 2015.01.08 වැනි දිනෙන් පසු විදේශීය දූත මණ්ඩලවලට දූත මණ්ඩල ප්‍රධානීන් හා නියෝජ්‍ය ප්‍රධානීන් ලෙස පත් කරන ලද පුද්ගලයින්ගේ නම් කවරේද;

(vi) එම පිරිස අතරින් ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් හා අයත් නොවන පුද්ගලයින්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

260/'15

ගරු (වෛද්‍ය) ඒ.ආර්.ඒ.හෆීස් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බ්‍රැන්ඩියාවත්ත, වෙලේවත්ත සහ වෙන්නවත්ත ප්‍රදේශ පහත්බිම් කලාපයක් වන බවත්;

(ii) එම ප්‍රදේශ හරහා ඇති ඇළ මාර්ග දීර්ඝ කාලයක් තිස්සේ සිට ශුද්ධ පවිත්‍ර නොකිරීම නිසා වැසි දිනවලදී ප්‍රදේශයේ නිවාස, වෙළඳසැල්, ආගමික සිද්ධස්ථාන සහ මංමාවත් සියල්ල ජලයෙන් යටවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ඇළ මාර්ග ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා උපදෙස් දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

268/'15

ගරු උදය ගම්මන්පිල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) එක්සත් රාජධානියේ, ශ්‍රී ලංකා මහ කොමසාරිස් ධූරයට මේ වනවිට පුද්ගලයෙකු පත් කර තිබේ නම්;

(i) එම පුද්ගලයාගේ නම කවරේද;

(ii) ඔහු පත් කළ දිනය කවරේද;

(iii) ඔහු පත් කිරීමට පෙර කෙතරම් කාලයක් තනතුර පුරප්පාඩුව පැවතිණිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක්සත් රාජධානියේ, ශ්‍රී ලංකා මහ කොමසාරිස් ධූරයට මේ වනවිට පුද්ගලයෙකු පත් කර නොමැති නම්;

(i) එකී තනතුර කෙතරම් කාලයක් පුරප්පාඩු වී පවතින්නේද;

(ii) මේ වනවිට තනතුර පිරිනැමීමෙන් පසු භාර ගැනීම ප්‍රතික්ෂේප කළ පුද්ගලයින් කවුරුන්ද;

(iii) එම පුද්ගලයින් තනතුර භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම තනතුර දීර්ඝ කාලයක් පුරප්පාඩු වී පැවතීමට හේතුව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2015 දෙසැම්බර් මස 19 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

255/'15

ගරු බිමල් රත්නායක මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011, 2012, 2013 සහ 2014 වර්ෂයන්හිදී,

(i) පොලිසියට ලැබී ඇති ළමා අපචාර පිළිබඳ පැමිණිලි සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) අධිකරණවල පවතින ළමා අපයෝජන නඩු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ළමා අපචාර සම්බන්ධව පොලිස් 'බී' වාර්තාව ඉදිරිපත් කළ පසු ඒවාට අධිචෝදනා පත්‍ර නිකුත් නොකරන ලද, නීතිපති දෙපාර්තමේන්තුව සතු නඩු සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

257/'15

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය කාලයේ අඛණ්ඩව පැවති වර්ෂාව හේතුවෙන් අධික ලෙස හානියට පත්වූ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ප්‍රධාන ජලාශ 61ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පදවිය කෘෂිකර්ම ජනපද වාරිමාර්ග ක්‍රමය අවුරුදු 40කට වැඩි කලක් ප්‍රතිසංස්කරණය කර නොමැති බව, පදවිය ඒකාබද්ධ කෘෂිකර්ම සංවිධානයේ සභාපති විසින් දන්වා ඇති බවත්;

(ii) පූර්ණ කෘෂිකාර්මික ප්‍රදේශයක් වන පදවිය ප්‍රදේශයට සෑම කන්නයකදීම නියමිත පරිදි වර්ෂාපතනය ලැබෙන බැවින් මෙම වාරිමාර්ග ක්‍රමය විධිමත්ව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

265/'15

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි 08 වැනිදායින් පසුව බලයට පත්වූ රජය මගින් ජාතික විධායක සභාවක් ආරම්භ කළ බව පිළිගන්නේද;

(ii) ජාතික විධායක සභාවේ අරමුණු කවරේද;

(iii) එහි සාමාජිකයින්ගේ නම් කවරේද;

(iv) ඔවුන් පත්කළ පදනම කවරේද;

(v) එම පත්කිරීම් කළ බලධාරියා කවුරුන්ද;

(vi) එම සාමාජිකයන් පත්කරන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ රටේ පවතින කවර නීතියක් යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික විධායක සභාව රැස් වූ වාර ගණන කවරේද;

(ii) එම රැස්වීම්වලදී ගත් තීරණ කවරේද;

(iii) ජාතික විධායක සභාව විසින් ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා ලද පියවර කවරේද;

(iv) එම සභාව දැනටත් ක්‍රියාත්මකව පවතින්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ජාතික විධායක සභාවට කවර හෝ පුරවැසියකු අත්අඩංගුවට ගන්නා මෙන් පොලීසිය වෙත නියෝග නිකුත් කිරීමට බලය තිබේද;

(ii) එසේ නම්, ඒ කවර නීතියක් යටතේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ජාතික විධායක සභාව, දේශපාලන නායකයින් අවමානයට ලක්කිරීම සඳහා පිහිටුවාගත් නීති විරෝධී දේශපාලන මෙවලමක් බව පිළිගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

269/’15

ගරු උදය ගම්මන්පිල මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වොක්ස්වැගන් මෝටර් රථ සමාගම ශ්‍රී ලංකාවේ දැවැන්ත ආයෝජනයක් සිදු කරන බවට අග්‍රාමාත්‍යතුමා විසින් කර ඇති ප්‍රකාශය පිළිබඳව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී සමාගම විසින් මෙරට ආයෝජනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයදුම්පතක් හෝ ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර තිබේද;

(ii) එකී සමාගම විසින් මෙරට අයෝජනය කරන මුළු මුදල කොපමණද;

(iii) එමගින් ජනනය කරන රැකියා අවස්ථාවන් ගණන කොපමණද;

(iv) මේ වනවිට එකී ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

278/’15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය සමයේ ආරම්භ කිරීමට කටයුතු කළ වරාය නගර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා අලුතින් ශක්‍යතා වාර්තාවක් ලබා ගන්නේද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් සිදු කරන්නේද;

(iv) එසේ නම්, කලින් සමාගමට ඒ සඳහා අයදුම් කළ හැකිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතියෙන් අප රටට ලැබෙන ප්‍රතිලාභ;

(ii) ව්‍යාපෘති ඉදිකිරීම්වලින් සාමාන්‍ය ජනතාවට ලැබෙන ප්‍රතිලාභ;

(iii) මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ නම්, ක්‍රියාත්මක කරනු ලබන කාල වකවානුව;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?